# බටහිර ආචාර විද්‍යාවේ ඉතිහාසය හා විෂය ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක්

An Introduction to History and Scop of Western Ethics

ගෝනලගොඩ නන්ද හිමි


## Abstract

Ethics as a moral philosophy could have come into existence with Greek philosophy, especially, Sophist philosophy. Before the advent of Greek philosophy, there had certain special ethical rules and moral codes. Therefore, ethics began with the first human moral thoughts. If it is so, ethics developed as moral philosophy of western from Greek philosophy. As such, Greek philosophy was the first period of the moral philosophy. After that, ethics develop as a sub field of Western philosophy from Greek to Contemporary philosophy. In terms of Greek ethics, it has several parts. But, medieval philosophy has changed the Greek ethical attainability. Medieval philosophers always tried to proof their teleology, but such ethical approach as in Greek moral philosophy was not found. The modern philosophy has certain special ethical theory other than medieval period. Virtually, contemporary philosophy is the most important philosophical project of moral philosophy. Contemporary moral philosopher questioned ethics what is good and bad. If it is not possible to vivificate ethical statement, those are called meaningless statements. Contemporary philosopher's argument was logical, descriptive, analytic and critical. When it comes to western moral philosophy, it has four branches. Namely, descriptive, Normative, Meta and Applied ethics.

The ethics is an essential part of our human world. In the absence of ethics, there emerges the bad. It is not a good thing for the better existence of the world. As such, ethics occupies a central position in the world for the better and viable functioning of the whole world.

**Keywords:** Moral, Ethics, Philosophy, Theory, Period

**හැඳින්වීම**

බටහිර ආචාරධර්ම හෙවත් සදාචාර දර්ශනයෙහි ඉතිහාසය හා විෂය ක්ෂේත්‍රය හඳුනා ගන්නේ කෙසේද? යන ගැටලුව මුල් කරමින් සිදු කරනු ලබන මෙම අධ්‍යයනයෙහි තේමා ත්‍රිත්වයක් යටතේ කරුණු සම්පිණ්ඩනය කර තිබේ. ආචාරධර්ම යන්නෙහි වාච්‍යාර්ථය සම්බන්ධයෙන් කරුණු විග්‍රහයක් පළමුවෙන් සිදු කෙරේ. අනතුරුව ග්‍රීක යුගයේ සිට සමකාලීන යුගය දක්වා කාලයෙහි සදාචාර දර්ශනය වර්ධනය වූ ආකාරය සාකච්ඡාවට ලක් කෙරෙන අතර බටහිර සදාචාර දර්ශනයෙහි මූලික විෂය ක්ෂේත්‍රය පිළිබඳව විග්‍රහ කෙරෙනුයේ ඉන් අනතුරුවයි. එහිදී විස්තරාත්මක ආචාරධර්ම, ප්‍රාමාණික ආචාරධර්ම, අධි ආචාරධර්ම හා ප්‍රායෝගික ආචාරධර්ම යන සදාචාර න්‍යාය පිළිබඳව කරුණු දක්වා ලීම සිදුකර තිබේ. ආචාරධර්ම වූ කලී වාස්තවික යහපත පිණිස හා උපයෝගිතාව පිණිස භාවිත කරන්නකි. එය සදාචාර පද්ධතියක් වශයෙන් ආරම්භ වනුයේ බටහිර ග්‍රීසිය කේන්ද්‍ර කරමිනි. එබැවින් මෙම අධ්‍යයනයෙහි අරමුණ වනුයේ එලෙස ග්‍රීසිය කේන්ද්‍ර කරමින් වර්ධනය වූ බටහිර ආචාරධර්මයන්හි ඉතිහාසය හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමයි. සදාචාර දර්ශනය හා න්‍යායන් පිළිබඳ ප්‍රවේශයක් ලබා ගැනීමට මෙන්ම ආචාරධර්මීය න්‍යායන්හි භාවිතය උදෙසා මෙම අධ්‍යයනය වැදගත් වේ.

**සාහිත්‍ය විමර්ශනය**

ඇලෙක්සැන්ඩර් රචිත (1888) Moral science යන කෘතියෙහි ආචාරධර්ම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත්තේ

සදාචාර විද්‍යාවක් වශයෙනි. ආචාරධර්ම හා ආචාර විද්‍යාව යන වචන භාවිත සම්බන්ධයෙන් ඇති ගැටුම නිරාකරණයේ දී මෙම ග්‍රන්ථය උපයෝගී වේ. මැකන්සි විසින් රචිතː1961) A Manual of Ethic කෘතියෙහි ආචාරධර්ම විද්‍යාවක් වශයෙන් ගත හැකි ද යන සාකච්ඡාව යම් ප්‍රමාණයක් සිදුව තිබේ. මෙහිදී බටහිර සදාචාර දර්ශනයෙහි ඉතිහාසය සම්බන්ධයෙන් නූතන යුගය දක්වා පැහැදිලි කිරීමක් සිදු කර ඇත. ෆ්‍රැන්කීනා රචිත 'Ethics' කෘතියෙහි සිංහල පරිවර්තනය වන ආචාර විද්‍යාව (1998) යන කෘතිය මෙහිදී ප්‍රධාන වශයෙන් භාවිත කෙරේ. සදාචාර දර්ශනයෙහි ඇති සියලු න්‍යායන් පිළිබඳ කරුණු දක්වාලීමක් මෙම ග්‍රන්ථයෙහි සිදුව නොමැත. හෝමාගම ධම්මානන්ද හිමියන් රචිත බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය (2014) කෘතියෙහි බටහිර සදාචාර දර්ශනයෙහි ස්වභාවය හා භාවිතය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කර තිබේ. ඊට අමතරව සදාචාර න්‍යායාන් පිළිබඳව ද කරුණු දක්වාලීමක් සිදු තිබේ. නාමලී කුමාරි හඳගම රචිත සදාචාර දර්ශනයේ ස්වභාවය (2021) කෘතියෙහි යුග වශයෙන් සදාචාර දර්ශනය වර්ධනය වූ ආකාරය දක්වා තිබේ. මීට අමතරව ආශ්‍රිත ග්‍රන්ථයන්හි ඇති කෘති උපයෝගී කරමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමවේදය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත.

**සාකච්ඡාව**

දර්ශන විෂයෙහි උප විෂය ක්ෂේත්‍රයන්ගෙන් එක් කොටසක් වශයෙන් ආචාර විද්‍යාව හැඳින්විය හැකිය. ආචාරධර්ම, ආචාර වාදය හා සදාචාර දර්ශනය ආදි ව්‍යවහාරිත නාමයන්ගෙන් හැඳින්වෙනුයේ ද ආචාර විද්‍යාවයි. 'එතික්ස්' (Ethics) යන ඉංග්‍රීසි පදයෙන් හැඳින්වෙන මෙය පුරාණ ග්‍රීක

සංස්කෘතිය තුළ 'පුද්ගල චරිතය' හෙවත් 'චර්යාව' යන්න හැඳින්වීම සඳහා භාවිත වූ 'ඊතෝස්' (Ethos) යන වචනය ඇසුරු කරමින් 'එතිකොස්' (Ethikos) යන්නෙන් භින්න වූවකි (ධම්මානන්ද හිමි, 2004: 65-66). මීට අමතරව සදාචාර දර්ශනය (Moral Philosophy) යනුවෙන් ද මෙය හැඳින් වේ. එහි 'Moral' යන වචනය ලතින් 'Mores' යන වචනයෙන් බිහිව තිබේ. එහි අර්ථය වනුයේ පුරුදු, චර්යාව යන්නයි.

ආචාරවිද්‍යාව, ආචාරධර්ම හා සදාචාර දර්ශනය එකම විෂය පථයක් වුවද එහි වචන භාවිතය සම්බන්ධයෙන් ඇතැම් තැන්හි විරෝධතා මතුව ඇත. ආචාරවිද්‍යාව යන වචනය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති අදහසක් වනුයේ ආචාරවිද්‍යාව යන්නට වඩා ආචාරධර්ම යනුවෙන් යෙදීම නිවැරදි බවයි. ආචාරවිද්‍යාව යන වචනය මෑතකදී භාවිතයට පැමිණි වචනයකි. (ෆ්‍රැන්කීනා, 1998: 09). ඊට ආචාර විද්‍යාව යන්නෙහි 'විද්‍යාව' යන වචනය භාවිත වී ඇත්තේ සමාන්‍ය ව්‍යවහාරයේ භාවිත විද්‍යාව (Science) යන අර්ථයෙන් නොව 'කිසියම් ක්‍රමානුකූල දැනීමක්' (Systematic Knowledge) යන අර්ථයෙන් බව විචාරක මතයයි. (ඥානසිරි, 2004: 09). නමුත් ආචාරධර්මය විද්‍යාවක් ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත්ව තිබේ.

Ethics is not a science at all, if by a science we understand the study of some limited department of human experience (Mackenzie, 2005: 17).

එය වැඩි දුරටත් විග්‍රහ කරන මැකන්සි සඳහන් කරනුයේ ආචාරධර්මය විද්‍යාවක් නොවන බවයි.

ඒ. ඊ. ටේලර් ද The problem of Conduct කෘතියෙහි ආචාරධර්ම දාර්ශනික විද්‍යාවක් සේ නොසැලකිය යුතු බව දක්වා ඇත. (මැකන්සි, 1969: 13). ආචාරධර්ම යන වචනයට ආචාර විද්‍යාව යනුවෙන් භාවිත කිරීම සිදු වූයේ විද්‍යාවේ වර්ධනයෙන් පසුව යැයි හැඟේ. විද්‍යාව ආකාර කිහිපයකින් හැඳින්විය හැකි වුව ද ඍජුවම නූතන විද්‍යාවේ වර්ධනය ඇති වූයේ කොපනිකන්

විප්ලවයෙන් පසුව වේ. කොපනිකන් විප්ලවය ඇති වීමත් සමග දර්ශනයෙහි ගමන් මගෙහි යම් පරිවර්තනයක් සිදු විය. මුල් කාලයෙහි විද්‍යාවෙන් එතරම් දැඩි බලපෑමක් දර්ශන විෂයට නොවූව ද නූතන දර්ශනයෙහි අවසාන අවධියෙහි විද්‍යාවේ බලපෑම තීව්‍ර විය. හේගේලියානු විඥානවාදය අභිබවාලමින් විද්‍යාව දියුණු වූයේ ඉන් අනතුරුවයි. එහි ප්‍රතිඵලයක් ලෙස දර්ශනයෙන් සාමාන්‍ය ජනයා ඈත් වූ අතර විශ්වවිද්‍යාලවලට පමණක් දර්ශනය සීමා විය. එයට විකල්පයක් ලෙස දර්ශනය නව ප්‍රවේශයකින් විස්තර කිරීම ආරම්භ කළහ. විද්‍යාවේ ආභාසය ලබමින් දර්ශනය වර්ධනය වනුයේ එතැන් පටන්ය. සමකාලීන විශ්ලේෂී දර්ශනය (Contemporary Analytical Philosophy) එහි ආරම්භයයි. සාම්ප්‍රදායික ආචාරධර්ම පිළිබඳ එතෙක් පිළිගත් සම්මතයෙන් ඔබ්බට ගොස් විශ්ලේෂී හා භාෂා දාර්ශනිකයන් ආචාරධර්මවලට නව පදනමක් දැමීය. නි. අධි ආචාරධර්ම (Meta Ethics). එම ආභාසය ලබමින් ආචාරධර්ම ද ආචාරවිද්‍යාව වශයෙන් භාවිත කිරීමට හුරු වූවා විය හැකිය. ඒ අනුව ආචාරධර්ම සඳහා ආචාරවිද්‍යාව යන්න භාවිත කරන බවත් ඒ සම්බන්ධයෙන් සංවාද ඇති බවත් ගම්‍ය වේ. එහෙත් මෙම පද ද්විත්වය සමානාර්ථයෙන් භාවිත කිරීමේ දෝෂයක් නොමැත.

මේ ආකාරයේ හඳුනාගත හැකි ආචාරධර්ම සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති නිර්වචන කිහිපයක් ඇසුරෙන් තවදුරටත් පැහැදිලි කිරීමට අපේක්ෂා කෙරේ. මහාචාර්ය පී. ඩී. ප්‍රේමසිරි ආචාරධර්ම නිර්වචනය කර ඇත්තේ 'ආචාර විද්‍යාව හෙවත් ආචාරධර්ම සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ මානව ගති පැවතුම්, චර්යා, පරමාර්ථ, අධිමුක්ති, අභිප්‍රාය, ජීවන ක්‍රම සහ සංස්ථා යන මේවායෙහි ලා කරනු ලබන ඇගයීම් පිළිබඳ විමර්ශනයක්' වශයෙනි. (ප්‍රේමසිරි, 1992: 1). ඒ අනුව ආචාරධර්ම මගින් සිදු කරනුයේ මානව ගති පැවතුම් ඇතුළු මානව චර්යාත්මක හා චේතනාත්මක ස්වභාවයන් පිළිබඳ ඇගයීමකි. ෆ්‍රැන්කීනාට අනුව ආචාර විද්‍යාව යනු සදාචාර ගැටලු සහ සදාචාර විනිශ්චය පිළිබඳ සදාචාර දර්ශනය හෙවත් දාර්ශනික චින්තනයයි. (ෆ්‍රැන්කීනා, 59). ඒ අනුව සදාචාරාත්මක ගැටලු සම්බන්ධයෙන් හා විනිශ්චයන්

සම්බන්ධයෙන් ඇති දාර්ශනික එළඹුම ආචාරධර්ම වේ. මොහුට අනුව සදාචාර දර්ශනයක් බිහි වනුයේ සම්ප්‍රදායානුකූල රීතියෙන් මෙහෙය වන අවස්ථාවෙන් ඔබ්බට ගමන් කළ විටය. ඒ අනුව සාමාන්‍යාර්ථයෙන් වියුක්ත වූ සදාචාරය පිළිබඳ චින්තනය සදාචාර දර්ශනයයි.

මහාචාර්ය ඇලෙක්සැන්ඩර්ට අනුව 'Ethics is not mere knowledge or speculation, like the science of Astronomy, Physiology or Psychology. it is knowledge applied to practice or useful ends' ආචාරධර්ම තාරකා විද්‍යාව, කායික විද්‍යාව හෝ මනෝවිද්‍යාව හා සමාන හුදු දැනුමක් හෝ කල්පිතයක් නොවේ. එය ප්‍රායෝගිකරණයට හෝ වැඩදායි අවසානයක් කරා දැනුම අදාළ කිරීමකි. (Bain 1888) මෙම පැහැදිලි කිරීමට අනුව ආචාරධර්ම විද්‍යාවක් හා සමාන දැනුමක් නොවේ. ප්‍රයෝගිකත්වය හා සම්බන්ධ භාවිතයකි. නොඑසේනම් වැඩදායි අවසානයක් කරා දැනුම මුහු කිරීමකි. ඇලෙක්සැන්ඩර්ගේ පැහැදිලි කිරීමට අනුව ආචාරධර්ම මිනිසාගේ ප්‍රායෝගික බව හා බද්ධව පවතී. ජොන්. එස්. මැකන්සිට අනුව 'Ethics, then, we may say, discusses men's habits and customs or in the other words their characters' ආචාරධර්ම වනුයේ මිනිසුන්ගේ පුරුදු, සිරිත් හෝ ඔවුන්ගේ චරිතයි. (Mackenzie, 1). මීට අමතරව බ්‍රිටැනිකා විශ්වකෝෂයෙහි දැක්වෙනුයේ සදාචාරමය වශයෙන් හොඳ හා නරක වන්නේ කුමක්ද? සදාචාරමය වශයෙන් හරි හා වැරදි වන්නේ කුමක් ද? ආදිය ආචාරධර්ම තුළින් සාකච්ඡා කෙරෙන බවයි. (https://www.britannica.com/topic/ethics-philosophy). මේ ආකාරයට හඳුනාගත හැකි ආචාරධර්මයන්හි මූලික පදනම වනුයේ පුද්ගල හැසිරීම හා ආකල්පයි. ඕනෑම සමාජයක පැවැත්මට අත්‍යවශ්‍ය කාරණයක් වශයෙන් ආචාරධර්ම පැවතිය යුතුය. ආචාරධර්ම පැවතීම මගින් ජීවිතයේ පරමාර්ථය පිළිබඳ ගැටලුව ගැඹුරින් ප්‍රතීයමාන කිරීමට, සදාචාරය සම්බන්ධයෙන් වඩා හොඳින් සිතීමට හා සමාන්‍ය සිතීමේ ක්‍රියාවලිය තියුණු කිරීමට හැකියාව ලැබේ. (Gensler, 1998: 5-6)

බටහිර සදාචාර දර්ශනයෙහි ඉතිහාසය සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි විශද වනුයේ එය දර්ශන ඉතිහාසය තරම් ඈතට ගමන් කරන බවයි. බටහිර දර්ශනය ආරම්භ වනුයේ තේල්ස් නමැති අයෝනියා දාර්ශනිකයාගෙනි. තෙල්ස්ට පූර්වයෙන් යම් යම් චින්තන ඉදිරිපත්ව තිබිණි. හෝමර් හා හෙසියඩ් එවැනි චින්තකයන් ලෙස හඳුනාගත හැකිමුත් ඔවුන් දාර්ශනිකයන් හා සමානත්වයේ නොගැනේ. එබැවින් බටහිර දර්ශනයෙහි පියා වශයෙන් හඳුන්වනුයේ තේල්ස්ය. බටහිර දර්ශනයේ පිතෘත්වය තේල්ස්ට හිමි වුව ද සදාචාර දර්ශනයේ පිතෘත්වය හිමි වනුයේ සොක්‍රටීස්ටය. 'සදාචාර දර්ශනයේ ආදි ශාස්තෘවරයා සොක්‍රටීස්ය' යනුවෙන් ෆ්‍රැන්ක්ලීනා දක්වා ඇත්තේ එයයි. (ෆ්‍රැන්කීනා, 54). ආචාරධර්ම සම්බන්ධයෙන් විධිමත්ව දාර්ශනිකව සාකච්ඡා කිරීමේ ආරම්භය එය වුවද සදාචාර චින්තනයෙහි ආරම්භය මානව ඉතිහාසයේ ආරම්භය දක්වා ගමන් කරන බව පෙන්වා දී තිබේ. Ethics could have come into existence only when human beings started to reflect on the best way to live. Accordingly, ethics began with the introduction of the first moral codes. (Levy, 2011: 2). මිනිසාගේ ප්‍රභවය පිළිබඳව නිශ්චිතව දැක්විය නොහැකි සේම ආරම්භක අවධියෙහි මානව ක්‍රියාකාරකම් කුමනාකාර දැයි යන්න ද දැක්විය හැකි නොවේ. එබැවින් මිනිසා යහපත් ආකාරයෙන් ජීවත් වීම ආරම්භ කළ දා පටන් සදාචාරය ද ආරම්භ වූ බව පෙන්වා දී තිබේ. මෙය පැරණි ආගමික සදාචාර පද්ධතිවලින් ගම්‍ය කළ හැකිය. බටහිර යුදෙව් ආගම සතු පැරණි තෙස්තමේන්තුවෙහි අන්තර්ගත උප්පත්ති කතා ඇසුරෙන් එවැනි තත්ත්වයන් අධ්‍යයනය කළ හැකිය. එහෙත් ඒවායෙහි අන්තර්ගත ආචාරාත්මක ඉගැන්වීම් සදාචාර දර්ශනයෙන් වෙනස් වේ. එම වෙනස සදාචාරවාදියා හා සදාචාර දර්ශනිකයා යනු කවරෙක් ද? යන්න විශද කිරීමෙන් ප්‍රකට කළ හැකිය. සදාචාරවාදියා යනු ආචාරධර්ම පිළිබඳ ලැයිස්තුවක් (List) ඉදිරිපත් කරමින් ඒවා පිළිපදින ලෙස උනන්දු කරන්නාය. එහෙත් සදාචාර දාර්ශනිකයා ඉන් වෙනස් වේ. සදාචාර දාර්ශනිකයාගේ කාර්ය වනුයේ සංකල්ප විග්‍රහ කිරීමයි. සදාචාර දාර්ශනිකයා සදාචාරවාදියෙකු වීම අවශ්‍ය නොවන බව ද දක්වනු ලැබේ. (තිලකරත්න, 2008: 51).

ආචාරධර්මයේ ඉතිහාසය මානව ඉතිහාසය දක්වා දිගු ඉතිහාසයකට ගමන් කළ ද නිශ්චිත වශයෙන් සදාචාර දර්ශනයක් බිහි වනුයේ ග්‍රීක යුගයේ සිටය. ග්‍රීක දර්ශනය තේල්ස්ගෙන් ආරම්භ වුවද සදාචාර දර්ශනයෙහි ආරම්භය සනිටුහන් වනුයේ ඉන් පසුවය. තේල්ස්, ඇනෙක්සිමැන්ඩර්, ඇනෙක්සිමීනිස් ආදී දාර්ශනිකයන් ආචාරධර්ම පිළිබඳ වැඩි අවධානයක් ගෙන ක්‍රියා කළ බවක් නොපෙනේ. ක්‍රි. පූ. 5-4 කාලයෙහි බිහි වූ සොෆිස්ට්වරු Sophisti (විතණ්ඩවාදීන්) බටහිර ආචාරධර්මවලට ප්‍රමුඛ පදනමක් දැමීය. ප්‍රොටගොරස්, ජෝර්ජියාස්, ත්‍රෙසිමාකස්, හිපියාස්, ප්‍රොඩිකස් වැනි දාර්ශනිකයන් ප්‍රධාන පෙළේ සොෆිස්ට්වරු වෙති. (රාජපක්ෂ, 1983: 2). සොෆිස්ට්වරු එතෙක් පැවති දාර්ශනික ගමන් මග වෙනස් කර නව මාවතක් ඔස්සේ සදාචාරාත්මකව සිතින්නට යොමු වූහ. මුදලට සිය දේශන සිදු කළ පිරිසක් වන මොවන් සදාචාරය උගන්වන ගුරුවරුන් වශයෙන් හැඳින්විණි. සොෆිස්ට්වරුන්ගේ ආචාරධර්මවල සංස්ථිතික බවක් නොමැති වීම විශේෂ කරුණකි. ඊට හේතුව වනුයේ ඔවුන් අතර දාර්ශනික වශයෙන් බැඳීමක් නොතැබීමයි. නමුත් සංකල්ප විග්‍රහයෙහි යම් ආවේණික බවක් දෘෂ්‍යමානය. සොෆිස්ට් ආචාරධර්මයන්හි ස්වභාවය පහත ප්‍රශ්නවලින් අවබෝධ කළ හැකි වේ.

1. ග්‍රීක දාර්ශනික සංකල්ප, සත්‍යය පිළිබිඹු කරයිද?
2. ග්‍රීක චාරිත්‍ර වාරිත්‍ර සත්‍යය මත ගොඩනැඟි ඒවාද?
3. ග්‍රීකයින් හා ම්ලේච්ඡයින් අතර වෙනසක් තිබේද?
4. ග්‍රීක ආචාරවාද යහපත මත ගොඩනැඟි ඒවාද?
5. වහලුන් හා ස්වාමීන් අතර වෙනසක් තිබේද? (කලන්සූරිය, 2002: 25).

මේ අනුව සොෆිස්ට්වරු ග්‍රීක සමාජයෙහි මුල්බැස පැවති ගැටලු පිළිබඳ ආචාරාත්මකව සිතන්නට යොමු විය. එහි ප්‍රතිඵලය වනුයේ නව ආකල්ප බිහි වීම හා පැවති සාම්ප්‍රදායික සදාචාරය

සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට යොමු වීමයි. සත්ගුණය (Virtue) සම්බන්ධ කථිකාව එහි කේන්ද්‍රීය ඉගැන්වීමක් වශයෙන් මතු වනුයේ එවිටය. සත්ගුණය භාවිත කරණ ලද්දේ 'තම නිසි කාර්ය හරියාකාරව කිරීම' යන අර්ථයෙනි. (රාජපක්ෂ, 3). එයින් අදහස් වනුයේ තමාට හිමි කාර්ය තමා සිදු කළ යුතුය යන්නය. (පැරණි බ්‍රාහ්මණ ඉගැන්වීම්හි අන්තර්ගත ස්වධර්ම මේ හා සමානය) වෛද්‍යවරයාට හිමි වනුයේ වෛද්‍ය වෘත්තියයි. එබැවින් එම කාර්ය සිදු කළ යුතු වේ. ප්‍රායෝගික ආචාරධර්මවලට හුරු කිරීමක් මින් සිදුවිණැ'යි අභ්‍යුගමනය කළ හැකිය. 'සියල්ලෙහිම මිණුම මිනිසාය (Man is the measure of all things) යන ප්‍රොටගෝරස්ගේ ඉගැන්වීම ප්‍රායෝගික බවට නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැකිය. (Stace, 1960: 112). මානව කේන්ද්‍රීය සංකල්පයක් වශයෙන් ඉන් ගම්‍ය වන මිනිසා යන සංකල්පය වාස්තවික මිනිසා යන සාමාන්‍ය අර්ථයෙන් භාවිත නොවේ. මිණුම යන්නෙන් අර්ථවත් වනුයේ සත්‍යයයේ ප්‍රමාණයයි. (Stace, 4) ඒ අනුව සත්‍යය කියා වාස්තවික යමක් නොමැත. එය පුද්ගල බද්ධ වේ. පරම සත්ගුණයක් නොමැති බව එම කියමනෙන් ගම්‍ය කළ හැකිය. එසේම සොෆිස්ට්වරුන්ගේ විශේෂත්වයක් වනුයේ අධිභෞතික ඉගැන්වීම් (පරම සත්ගුණ) ප්‍රතික්ෂේප කිරීමයි. අධිභෞතික හා සාම්ප්‍රදායික සංකල්පයන්ගෙන් වියුක්ත වූ ප්‍රායෝගික ආචාරධර්ම පද්ධතියක් බිහි කිරීමට සොෆිස්ට්වරු කටයුතු කර ඇති බව මින් පැහැදිලි වේ.

සොෆිස්ට්වරුන්ගේ ආචාරධාර්මික එළඹුම වෙනස් කරමින් නව ආචාරධර්මික සංකථනයක් ඉදිරිපත් කළ දාර්ශනිකයා වනුයේ සොක්‍රටීස්ය. මොහු ආචාරවිද්‍යාවේ ප්‍රමුඛයා වශයෙන් ද හඳුන්වනු ලැබේ. සොක්‍රටීස්ගේ ආචාරධාර්මික ඉගැන්වීම් මෙන්ම දර්ශනය ද අධ්‍යයනය කළ හැකි වනුයේ පසුකාලීනයන් (ප්ලේටෝ, ඇරිස්ටෝටල්) රචිත කෘතිවලිනි. එහිදී Crito & Phaedo යන සංවාද සුවිශේෂී වේ. සොක්‍රටීස්ගේ ආචාරවාදී ඉගැන්වීම ඥානය හා සත්ගුණය මත පදනම් වන බව සිතිය හැකිය. මොහු දක්වනුයේ සත්ගුණය ඥානය වේ. ඥානය සත්ගුණය වේ (Virtue in knowledge, knowledge virtue) යනුවෙනි. (සිල්වා, 28). ඒ

අනුව ඥානය අත්‍යවශ්‍ය අංගයක් ලෙස මොහු පෙන්වා දී තිබේ. මොහුට අනුව පුද්ගලයාට නිවැරදි ඥානයක් තිබිය යුතුය.

සදාචාර හැසිරීම සදාචාර සංකල්ප මගින් මෙහෙයවයි. ඒවා අවුල් නම් අපැහැදිලි නම් වැරදිවලට වැටේ. ඒ ක්‍රියා කිරීමේ දී වැරදි ඇති වේ. මෙම වැරදිවලින් බේරීමට නම් පැහැදිලි ඥානයක් තිබිය යුතුය. පැහැදිලි ඥානයක් ඒවා පිළිබඳ ඇත්නම් වැරදිවලට නොවැටේ. සදාචාරය පිළිබඳ නිදහස ලැබෙන්නේ මෙම පැහැදිලි ඥානයෙන් පසුවය. (රාජපක්ෂ, 10).

සොක්‍රටීස්ගේ පැහැදිලි කිරීමට අනුව යහපත් ආචාරධර්මයක් පැවතීමට පැහැදිලි ඥානයක් තිබිය යුතුය. ඥානය නොමැති විට සදාචාරයක් ඇති නොවේ. එය සිය ක්‍රියාවෙන්ම සොක්‍රටීස් විසින් තහවුරු කර තිබේ. සිර මැදිරියේ සිටි අවසන් හෝරාවේ පවා ඔහුට පැන යාමට හැකියාව තිබිණි. එහෙත් එසේ නොකර සිර මැදිරියේ සිට මරණයට ලක් වූයේ ඥානය පැවති බැවිනි. එය මෝඩ ඥානයකැ'යි තර්ක කළ හැකි වේ. එහෙත් සදාචාරය ප්‍රතික්ෂේප කිරීම හෝ ඡේදනය කිරීම නොකර තම ඇගයුම වෙනුවෙන් පෙනී සිටීම මත මොහු සැබෑ සදාචාර දාර්ශනිකයෙකු ලෙස ඇගයුමට ලක් කළ හැකිය. එය මොහුගේ අවසන් උපදේශයෙන් තවදුරටත් ගම්‍ය වේ. 'මම ස්ථිරව කියමි, මහත්වරුනි, බේරීමට බැරි එකම දෙය නම් මරණය නොවෙයි, දුෂ්චරිතයයි'. සොක්‍රටීස්ගේ ආචාරධාර්මික ඉගැන්වීමෙහි විශේෂත්වයක් වනුයේ ආත්මාර්ථයට පමණක් සීමා නොවීමයි. මොහුට අනුව වඩාත් සතුටින් සිටින පුද්ගලයා රාජ්‍ය පාලකයා වේ. ඊට හේතුව අන්‍යන්ට විශාල සේවයක් කිරීමට හැකිවීමය. මින් ගම්‍ය වනුයේ ආත්මාර්ථය පමණක් නොව පරාර්ථකාමී බව ද තිබිය යුතු බවය.

ග්‍රීක ආචාරධර්ම සම්බන්ධයෙන් විමසීමේ දී ප්ලේටෝගේ ආචාරධර්ම පද්ධතිය ද සුවිශේෂී වේ. මොහුගේ ආචාරධර්ම පිළිබඳ විග්‍රහ ඥානවිභාගීය හා දේශපාලන විග්‍රහයන්ගෙන් වෙන්කර හඳුනා ගැනීම අසීරුය. ඒවා එකිනෙක සම්බන්ධව පැවතීම ඊට

හේතුවයි. මොහු ග්‍රීක සදාචාර සංකල්ප වන යුක්තිය, ප්‍රඥාව, ධෛර්යය හා සංයමය යන කරුණු සතර සම්බන්ධයෙන් වැඩි වශයෙන් විස්තර කර ඇත. එසේ විස්තර කිරීමෙන් බිහි වනුයේ සදාචාර දර්ශනයයි.

පවතින සදාචාරය එලෙසින් පිළිගැනීම වෙනුවට ප්‍රශ්න කිරීම කළ යුතු වේ. එබැවින් ප්ලේටෝගේ ආචාරධර්ම පිළිබඳ විග්‍රහ සුවිශේෂී ද වේ. ප්ලේටෝට අනුව සදාචාරය නෛසර්ගිකව පුද්ගලයා තුළ පවතී. (සිල්වා, 37). එය රතුපාට මලක් මෙනි. රතු පාටින් මල හෝ මලින් රතු පාට විතැන් කළ හැකි නොවේ. එබැවින් පුද්ගලයා සතුව සදාචාරය පවතී. එකී සදාචාරාත්මක යහගුණ ආරක්ෂා කිරීමෙන් සොම්නස උදාකළ හැකිය.

ග්‍රීක සම්භාව්‍ය අවසන් දාර්ශනිකයා වශයෙන් හඳුනාගත හැකි ඇරිස්ටෝටල්ගේ ආචාරධර්මයන්හි විශේෂත්වය වනුයේ ද දේශපාලනය හා බැඳී පැවතීමයි. 'Politics is not a separate of Ethics' යනුවෙන් දැක්වෙන පරිදි දේශපාලනය හා ආචාරධර්ම පිළිබඳ ඇරිස්ටෝටලියානු විග්‍රහය අන්‍යොන්‍යත්වයෙන් යුක්තය. (Stace, 320). මොහුගේ ආචාරධර්ම හඳුනා ගැනීමට ග්‍රන්ථ ත්‍රිත්වයක් ඇත.

1. යුඩේමියන් ආචාරධර්ම
2. මැග්නා මොරාලියා ආචාරධර්ම
3. නිකොමැකියන් ආචාරධර්ම

මේ ආකාරයෙන් හඳුනාගත හැකි ඇරිස්ටෝටල්ගේ ආචාරධර්මවල විශේෂත්වයක් වනුයේ මධ්‍ය ප්‍රමාණය පිළිබඳ අර්ථකථනයයි. මොහුට අනුව යම් ක්‍රියාවක් සිදු කිරීමට පෙර මධ්‍ය ප්‍රමාණය තීරණය කළ යුතුය. එහිදී කරුණු හයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

1. නිවැරදි වෙලාව
2. නිවැරදි අවස්ථාව
3. නිවැරදි මිනිසා
4. නිවැරදි අරමුණ
5. නිවැරදි මාර්ගය
6. නිවැරදි ප්‍රමාණය

මෙම මධ්‍ය ප්‍රමාණය සත්ගුණයෙහි ද අනුගමනය කළ යුතුය. එසේ නොමැති විට හිරිහැර ඇති වේ. මධ්‍ය ප්‍රමාණය තොරාගැනීමේ දී ගැටලු ඇතිවීම නොවැළැක්විය හැකිය. එබැවින් සියල්ලටම මධ්‍ය ප්‍රමාණය නොමැති බව ඇරිස්ටෝටල් දක්වයි. නි. ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, කාමයෙහි වරදවා හැසිරීම, මිනිමැරීම, හොරකම් කිරීම ආදියෙහි මධ්‍ය ප්‍රමාණයක් නොමැත. ඇරිස්ටෝටල්ගෙන් පසුව ග්‍රීක සම්භාව්‍ය දර්ශනය අවසන් වේ. එහෙත් ඇරිස්ටෝටල්ගෙන් ග්‍රීක දර්ශනය අවසන් නොවේ. ඊට පසුව ද විවිධ දාර්ශනික ඥාන සම්භාරයන් එකතු විය. එපිකියුරියානු ආචාරධර්ම, ස්ටොයික් ආචාරධර්ම, සිනික්වාදී ආචාරධර්ම, මෙගරිකයන්ගේ ආචාරධර්ම හා සංශයවාදී ආචාරධර්ම ග්‍රීක දර්ශනයෙහිලා බිහි වූ ආචාරධර්ම වේ.

මෙතෙක් සාකච්ඡා කළ ග්‍රීක ආචාරධර්මවල විශේෂත්වය වනුයේ වෙනස් වෙනස් ආකෘතීන්ගෙන් යුක්ත වීමයි. පද්ධතිගත දර්ශනයක් වශයෙන් හඳුනාගත නොහැකි ග්‍රීක දාර්ශනික අවධිය බහුත්වවාදී දාර්ශනික යුගයකි. ආචාරධර්ම පිළිබඳ එකඟතාව ද එසේමය. ග්‍රීක යුගයේ දී වෙනත් වෘත්තීන් පදනම් කරමින් සදාචාර පද්ධති බිහි ව තිබේ. ඇතැම් දේශපාලන විග්‍රහ ආචාරධර්මයෙන් විතැන් කළ නොහැකි වනුයේ ඒ හේතුවෙනි. මෙහිදී වෛද්‍ය වෘත්තිය සඳහා වෙනම ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දී තිබිණි. වෛද්‍ය විද්‍යාවෙහි පියා වශයෙන් හැඳින්වෙන හිපොක්‍රොටිස් (5-4 B.C.) එහිදී විශේෂ වේ. හිපොක්‍රොටිස් දිවුරුම THE

HIPPOCRATIC OATH යනුවෙන් හැඳින්වෙන මින් අපේක්ෂා කර ඇත්තේ සිය වෘත්තිය විෂයෙහි පැවතිය යුතු ආචාරධර්ම පද්ධතීන් කඩ නොකොට සුරක්ෂිත කිරීමයි. :ජ්ජනිදබල 2014ඵ 17*ග ඒ අනුව ග්‍රීක යුගයෙහි විවිධ ආචාරධර්ම පද්ධතීන් බිහිව ඇති බව ගම්‍ය කළ හැකිය. එහෙත් මෙම එළඹුම මධ්‍යතන අවධියෙහි (Medieval period) ආරම්භයත් සමග බිඳ වැටිණි.

බටහිර දර්ශනයෙහි දීර්ඝ කාලයක් පැවතියේ මධ්‍යතන යුගයයි. පල්ලියේ දර්ශනය වශයෙන් ද හැඳින්වෙන මෙම අවධිය පල්ලිය මත පදනම් වෙමින් ක්‍රියාත්මක විය. පැරණි ගිවිසුම (Old Testament) හා නව ගිවිසුම (New Testament) මත පදනම් වෙමින් ආගමික සදාචාරයක් බිහි වුවද ආදි දේවධර්මය මත පදනම් වූ සදාචාර දර්ශනයෙහි වර්ධනයට මෙම තෙස්තමේන්තු බාධාවක් විය. (Osborne, 2013: 3187–3198). පල්ලියේ දේවධර්මය (Theology) විශ්වාස කිරීම පරමත්‍වය වශයෙන් විශ්වාස කළ මධ්‍යතන වැසියන් දෙවියන් වහන්සේ පිළිබඳ ප්‍රශ්න කරන්නට බිය විය. එහි ප්‍රතිඵලය වනුයේ දාර්ශනික වශයෙන් අඳුරු යුගයක් බිහි වීමයි. ඔගස්ටීන්, ඇන්ස්ලම් හා ඇක්වයිනාස් වැනි දාර්ශනිකයන් ප්‍රමුඛ වශයෙන් බිහි වුවද ඔවුන්ට දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයෙන් මිදිය නොහැකි විය. නමුත් පැරණි තෙස්තමේන්තුවෙහි ඇති අදහස් නව්‍යකරණයට ලක්කර අලුත් තෙස්තමේන්තුවක් බිහිවීම මෙහි කැපී පෙනෙන ආචාරාත්මක සිදු වීමකි. ප්‍රතිඵලාත්මකවාදී ආචාරධාර්මික අදහස් යුදෙව් හෙවත් පැරණි තෙස්තමේන්තුවෙහි අන්තර්ගතව පැවතිණි. ඒ වෙනුවට සහනශීලී ආචාරධාර්මික ඉගැන්වීම් නව තෙස්තමේන්තුව මගින් ඉදිරිපත් කර තිබේ. මධ්‍යතන දර්ශනයෙහි එන ආචාරවාදී තර්කය හෙවත් සදාචාර තර්කය ආචාරධර්මී ප්‍රවේශයකින් ඉදිරිපත් කර තිබේ. එහෙත් එහි අන්තර්ගත වනුයේ 'පරම යහපත දෙවියන් වහන්සේය' යන ඉගැන්වීමයි. ක්‍රිස්තියානි පල්ලියේ ආචාරධර්ම සේම ඉස්ලාමික් ආචාරධර්මයන්ගේ වර්ධනයක් ද මෙකල සිදු විය. අවිසෙනා, ඇවරෝස් හා අල්සසාලි වැනි ඉස්ලාමික් දාර්ශනිකයන් එහිදී සුවිශේෂී වේ. (හඳගම, 90).

මධ්‍යතන අවධියෙන් පසුව බිහිවනුයේ නූතන දර්ශනයයි. නූතන අවධියෙහි දේශපාලනය, ආර්ථිකය ආදි විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් සදාචාර පද්ධති බිහිව තිබේ. නිකොලො මැකියාවෙලි (1469–1527)" තොමස් හෝබ්ස් ꞉1588–1679), හෙන්රි මෝ (1614–87), සැමුවෙල් ක්ලාක් (1675–1729), බෙනඩික් ස්පිනෝසා (1632-1677), ජොසප් බට්ලර් (1692–1752,) ඩේවිඩ් හ්‍යුම් (1711–76), ජෙරමි බෙන්තම් (1748–1832), ජොන් ස්ටුවට් මිල් (1806–73) වැනි දාර්ශනිකයන් එහිලා ප්‍රධාන වේ. (https://www.britannica.com/topic/ethics-philosophy/The-history-of-Western-ethics).

ප්‍රමාණාත්මක සදාචාර න්‍යායක් වශයෙන් යුක්ත්‍යාත්මවාදී අදහස් වර්ධනය වනුයේ මෙම අවධියේය. ඉමානුවෙල් කාන්ට් එහි ප්‍රධාන වේ. නූතන අවධියෙන් පසුව බිහි වනුයේ සමකාලීන අවධියයි. ආචාරධර්ම සම්බන්ධයෙන් දාර්ශනික සාකච්ඡා බහුල වශයෙන් සිදු වූ අවධියක් වශයෙන් මෙම අවධිය සැලකිය හැකිය. නූතන යුගයෙහි අවසානයත් සමග විශ්ලේෂී දර්ශනය බිහි විය. ස්වභාවික භාෂාව වෙනුවට ස්වභාවික භාෂාවක (Non-natural language) අවශ්‍යතාව මතු වීම විශ්ලේෂී සම්ප්‍රදායෙහි සුවිශේෂීත්වයකි.

- අධි භෞතිකවාද
- ආගම්
- ආචාරධර්ම
- සෞන්දර්යවාද (කලන්සූරිය, 2008꞉ 121).

යනාදියෙහි අන්තර්ගත 'වාක්‍ය හා කියමන් සත්‍යාපනය කළ යුතුය' යන සංවාදය ඇති වනුයේ විශ්ලේෂී දර්ශනයෙහි ආරම්භයත් සමගිනි. සත්‍යාපනය කළ නොහැකි කියමන් 'අර්ථශූන්‍යය' යනුවෙන් නව සාකච්ඡාවක් ඇති විය. එහිදී ආචාරධර්ම විෂයෙහි සිදුවූ බලපෑම සුවිශේෂී වේ. ආචාරධර්ම

සත්‍යාපනය කළ නොහැකිය. නි. හොඳ යනු කුමක්ද? යන්න සත්‍යාපනය කළ හැකි නොවේ. එබැවින් ආචාරධර්ම විෂයෙහි නව ප්‍රවේශයක් ඇතිවීම මෙමගින් සිදු විය. ජී. ඊ. මුවර් (1873-1958), ඒ. ජේ. එයර් (1910-1989), ආර්. එම්. හෙයාර් (1919-2002) වැනි සමකාලින සදාචාර දාර්ශනිකයන් සුවිශේෂී වේ. මීට අමතරව සාංදෘෂ්ටිකවාදී දාර්ශනිකයන් ද ආචාරාත්මක බව අගය කර තිබේ. කියකිගාඩ් ජීවිතයේ අවධීන් තුනක් ඇති බව දක්වා ඇත. ඉන් එක් අවධියක් වනුයේ ආචාරාත්මක අවධියයි. ආගමික අවධියට පත් වනුයේ ආචාරාත්මක අවධියෙන් පසුවය. මේ ආකාරයට පැහැදිලි වනුයේ ග්‍රීක යුගයේ පටන් සමකාලීන යුගය දක්වා ආචාරධර්ම වර්ධනය වූ බවයි. එලෙස වර්ධනය වූ ආචාරධර්ම විෂයෙහි, විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙතැන් සිට සාකච්ඡා කරනු ලැබේ.

- විස්තරාත්මක අචාරධර්ම (Descriptive Ethics)
- ප්‍රාමාණික ආචාරධර්ම (Normative Ethics)
- අධි ආචාරධර්ම (Meta Ethics)
- ප්‍රායෝගික ආචාරධර්ම (Applied Ethics)

සදාචාර තේරීම්, සදාචාර විනිශ්චය හා සදාචාර ඇගයුම් වැනි සිද්ධිවාචක කරුණු පිළිබඳවත් ඒවා සමාජයෙන් සමාජයට බලපාන අන්දමත් විස්තරාත්මක ආචාරධර්මවලින් සාකච්ඡා කෙරේ. ඒ අනුව මිනිසුන්ගේ සදාචාරය සම්බන්ධ ඇගයුම් විස්තර කිරීම මෙමගින් සිදු වේ. යම් සදාචාරාත්මක ඇගයුමක් එක් ස්ථානයකට සම්මත වුවද තවත් ස්ථානයකට වලංගු නොවේ. වාස්තවික නොවීම ඊට හේතුවයි. මේ සම්බන්ධයෙන් දාර්ශනිකව විස්තර කිරීම සිදු කරනුයේ විස්තරාත්මක සදාචාර දාර්ශනිකයන් විසිනි. එහිදී පුද්ගල ක්‍රියාවන්හි හරිවැරදි විභාග කිරීමක් සිදු නොවන අතර හේතු දැක්වීමක් හා විස්තර කිරීමක් පමණක් සිදු වේ.

සදාචාර දර්ශනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි ප්‍රමාණික ආචාරධර්ම සුවිශේෂී වේ. සදාචාර හැසිරීම්

සම්බන්ධයෙන් ඇගයුම් ඉදිරිපත් කිරීමත් ඒවායේ තාර්කික පදනම සොයා බැලීමත් සිදු කෙරෙනුයේ ප්‍රමාණික ආචාරධර්මවලිනි. ආචාරධර්ම හඳුනා ගැනීම, ඇගයීම හා සදාචාර මග පෙන්වීම මෙහි මූලික කාර්ය වශයෙන් හඳුනාගත හැකිය. ආගමික ශාස්තෘවරුන් හා දාර්ශනියකයන් ඉදිරිපත් කර ඇති බොහෝ ආචාරධර්ම පද්ධති ප්‍රමාණික ආචාරධර්ම මත පදනම්ව ඉදිරිපත් කර තිබේ. (වීරවර්ධන, 2007, 119). මීට අමතරව සමකාලීන දාර්ශනිකයන්ගේ අදහස වනුයේ ග්‍රීක දාර්ශනික අවධියේ සිට සමකාලීන අවධියය තෙක් දර්ශන ඉතිහාසයේ විද්‍යමාන සදාචාර සංකල්ප ප්‍රමාණික කාර්යන් බවයි. ඒවා ප්‍රමාණික මූල ධර්ම ද්විත්වයක් යටතේ විග්‍රහ කර ඇත. සාධ්‍යතාවාදී මූලධර්මය (Teleological theory) හා යුක්ත්‍යාත්මවාදී මූලධර්මය (Deontological theory) යනුවෙන් හැඳින්වෙනුයේ එයයි.

උපයෝගිතාවාදය

සාධ්‍යතාවාදී මූලධර්මය

ආත්මාර්ථ සුඛපරමවාදය

පරාර්ථ සුඛපරමවාදය

ක්‍රියා යුක්ත්‍යාත්මවාදී න්‍යාය

යුක්ත්‍යාත්මවාදී මූලධර්මය

රීති යුක්ත්‍යාත්මවාදී න්‍යාය

ඉහත සඳහන් ආකාරයේ ප්‍රභේදයන්ගෙන් ප්‍රමානීක ආචාරධර්ම පිළිබඳ විස්තර වේ. ජෙරමි බෙන්තම් වැනි දාර්ශනිකයන් සාධ්‍යතාවාදය දියුණු කිරීමෙහිලා ද ඉමානුවෙල් කාන්ට් යුක්ත්‍යාත්මවාදය දියුණු කිරීමෙහිලා ද කටයුතු කර තිබේ. සාධ්‍යතාවාදීන්ට අනුව යම් ක්‍රියාවක් හොඳ හෝ නරක වශයෙන් තීරණය කිරීමට පරම නිෂ්ටාව නම් (අවසානයක්) සංකල්පයක් උපයෝගී වේ. නි. යම් ක්‍රියාවක ප්‍රතිඵලය විය යුත්තේ බහුතර

උපයෝගිතාව ද තමාගේ සැපය ද අන් අයගේ සැපය ද යනුවෙන් සිතා විමසා කටයුතු කිරීම. එහෙත් පරම නිෂ්ටාව සම්බන්ධයෙන් එකඟතා නොමැති බැවින් තවත් ශාකාවලට බෙදී තිබේ. යුක්ත්‍යාත්මවාදීහු යුතුකම පරමත්‍වය වශයෙන් සලකා ඇත. ඉමානුවෙල් කාන්ට් 'යුතුකම උදෙසා යුතුකම ඉටුකරන්න' යනුවෙන් දක්වා ඇත්තේ එබැවිනි. සමාකාලීන අවධියෙහි බිහි වූ සදාචාර පද්ධතියක් ලෙස අධි ආචාරධර්ම හඳුනාගත හැකිය. අධි ආචාරධර්ම යන යෙදුම 1949 දී එයර් විසින් 'සදාචාර විනිශ්චයන්' පිළිබඳ විග්‍රහයක දී ප්‍රථම වරට භාවිත කර තිබේ. මෙහි අරමුණ වනුයේ සදාචාර සංකල්ප තාර්කිකව විරණය කිරීම හෝ අර්ථ විශ්ලේෂණය කිරීමයි. ඒ අනුව අධි ආචාරධර්මයන්හි මූලික ස්වභාවය වනුයේ සදාචාරාත්මක සංකල්ප විමසීමට ලක් කිරීමයි. හොඳ යනු කුමක් ද? එහි අර්ථය කවරෙක් ද? මෙය විස්තරාත්මක, විශ්ලේෂී හා විචාරාත්මක වූවකි. (හඳගම, 31). අධි ආචාරාත්මක මූල ධර්ම කිහිපයක් බිහිව ඇත.

- ස්වභාවවාදය (Naturalism)
- න-ස්වභාවවාදය (Non -naturalism)
- ප්‍රතිභානවාදය (Intuitionism)
- චිත්තවේගවාදය (Emotivism)
- නිර්දේශාත්මකවාදය (Prescriptivism)

ආචාරධර්ම ක්ෂේත්‍රයෙහි ජනප්‍රිය තේමාවක් වශයෙන් ප්‍රයෝගික ආචාරධර්ම (ව්‍යවහාරික ආචාරධර්ම) හඳුනාගත හැකිය. මෑතකදී ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ ප්‍රයෝගික ආචාර ධර්මවලින් සොයා බැලෙනුයේ දෛනික ජීවිතයේ ප්‍රායෝගික පැතිකඩයි. ප්‍රායෝගික ආචාරධර්ම බොහෝ විෂයන්වල අන්තර්ගත වේ. වර්තමානයෙහි ඉතා ජනප්‍රිය වුව ද ප්‍රායෝගික ආචාරධර්මවල ඉතිහාසය ග්‍රීක යුගය දක්වා ගමන් කරයි. වෛද්‍ය වෘත්තියට අදළව හිපොක්‍රීටස් විසින් වෛද්‍ය ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා

දීම එහි ඓතිහාසික සිදුවීමකි. ප්‍රායෝගික ආචාරධර්ම පද්ධති කිහිපයක් පහත වේ.

- වෛද්‍ය ආචාරධර්ම
- පරිසර ආචාරධර්ම
- නීති ආචාරධර්ම
- දේශපාලන ආචාරධර්ම
- ආර්ථික ආචාරධර්ම
- ජීව ආචාරධර්ම
- ක්‍රීඩා ආචාරධර්ම

යනාදී වශයෙන් ප්‍රායෝගික ආචාරධර්ම සමහරක් දක්වාලිය හැකිය. බටහිර ආචාර ධර්මයන්හි ප්‍රධාන ලක්ෂණයක් වනුයේ කලින් කලට අවශ්‍යතාව මත සංශෝධනයට ලක් වෙමින් ඉදිරිපත් වීමයි. පොදුවේ මිනිසා ද ඇතුළු සමස්ත පරිසරයේ මනා පැවැත්මට ආචාර ධර්මයන්ගෙන් බලපෑම අත්‍යවශ්‍ය සාධකයක් බව පෙන්වා දිය හැකිය. යම් හෙයකින් ආචාරධර්ම පද්ධති බිඳ වැටුණ හොත් බිහිවනුයේ පිරිහීමයි. එබැවින් යම් යම් ආචාරධර්මයන්ට එකඟව ක්‍රියා කිරීම වාස්තවික පැවැත්ම පිණිස වන්නකි.

**සමාලෝචනය**

බටහිර ආචාරධර්ම සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය මූලික වශයෙන් කොටස් තුනක් ආවරණය වන සේ සම්පාදිතය. පළමුවෙන් ආචාරධර්ම යන පදය පිළිබඳ විග්‍රහයක් සිදුකර ඇත. ආචාරධර්ම හා ආචාරවිද්‍යා භාවිතය සම්බන්ධයෙන් පැනනැගී ඇති අර්බුද අතරත භාවිතය සම්බන්ධයෙන් අර්බුදයක් නොමැති බව දක්වා ඇත්තේ සම්මත 'විද්‍යා' අර්ථයෙන් පමණක් ආචාරවිද්‍යාව භාවිතයට නොගත හැකි බව පෙන්වා දෙමිනි.

අනතුරුව බටහිර ආචාරධර්මයන්හි ඉතිහාසය පිළිබඳ ග්‍රීක යුගයේ සිට සමකාලීන යුගය දක්වා අධ්‍යයනයට ලක් කෙරිණි. ආචාරධර්ම සම්බන්ධයෙන් දාර්ශනිකව සාකච්ඡා කිරීම ග්‍රීක යුගයේ පටන් සිදු වුව ද ඉන් පෙරත් විවිධ ඇගයුම් පද්ධති පැවති බව හඳුනාගත හැකි විය. බටහිර ආචාරධර්මයන්හි විෂය ක්ෂේත්‍රය විස්තරාත්මක ආචාරධර්ම, ප්‍රාමාණික ආචාරධර්ම, අධි ආචාරධර්ම හා ප්‍රායෝගික ආචාරධර්ම යන ප්‍රධාන තේමාවන්ට සීමාවෙමින් දක්වා ඇත. ඒ ඒ තේමාවන් කොටස්වලට බෙදෙන ආකාරය අනුකොටස් මගින් දක්වා තිබේ. මේ ආකාරයට සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනයෙන් ගම්‍ය වනුයේ බටහිර ආචාරධර්ම විවිධ සාකච්ඡාවන්ට ලක් වෙමින් දියුණුවට පත්ව ඇති බවයි. එම දියුණුව සිදුව ඇත්තේ වාස්තවික පැවැත්ම උදෙසාය. යම් හෙයකින් ආචාරධර්ම පද්ධති බිඳ වැටුණ හොත් නිර්මාණය වනුයේ අයහපතය. එබැවින් වාස්තවික පැවැත්මෙහිලා අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් මිනිසා සතුව ඇති සාධනීය අංගයක් ලෙස ආචාරධර්ම පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

කලන්සූරිය, ඒ.ඩී.පී. (2002). දර්ශනය හැඳින්වීමක්. වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

කලන්සූරිය, ඒ.ඩී.පී. (2008). බටහිර විශ්ලේෂී දර්ශනය. වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

ඥානසිරි, පී.ජී. (2004). ආචාර වාදය - හැඳින්වීමක්. වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

ධම්මානන්ද හිමි, හේමාගම. (2004). බෞද්ධ හා කානිටියානු සදාචාර දර්ශනය. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රේමසිරි, පී.ඩී. (1992). බෞද්ධ ආචාර ධර්ම. කොළඹඃ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

මැකන්සි, ජෝන්. එස්. (1969). ආචාර ධර්ම අත්පොත - සිංහල පරිවර්තනය. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රාජපක්ෂ, රෙජිංටන්. (1983) ග්‍රීක ආචාරධර්ම. ස්ථානය සඳහන් නොවේ, කතෘ ප්‍රකාශන.

වීරවර්ධන, සුමේධ. (2007). ආචාර විද්‍යා අධ්‍යයන ලිපි. කතෘ ප්‍රකාශන.

හඳගම, නාමලී කුමාරි. (2021). සදාචාර දර්ශනයේ ස්වභාවය. වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

ෆ්‍රැන්කීනා, ඩබ්ලිව්.කේ. (1998). ආචාර විද්‍යාව. (පරි.) පී.ඩී. ප්‍රේමසිරි, කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bain, Alexander. (1888). Moral science. New York: D. Appleton and company.

Blackburn, Simon. (2016). Oxford Dictionary of Philosophy. United Kingdom: Oxford University press.

Harry J. Gensler. (1998). Ethics A Contemporary Introduction. New York: Routledge.

The History of Western Ethics. (2011). (ed.) Michael l. levy. New York: Britannica Educational Publishing.

Jackson, Mark. (2014). The History of Medicine. U.K: Oneworld Publications.

Mackenzie, John.S. (2005-reprint). A Manual of Ethics. New York: Cosimo – Inc.

Stace, W.T (1960). A Critical History of Greek Philosophy. New York: Macmillan & Co LTD.

Thomas M. and Osborne, Jr. (2013). Medieval Ethics", The International Encyclopedia of Ethics (ed.) Hugh LaFollette, U.S: Blackwell Publishing Ltd,

https://www.britannica.com/topic/ethics-philosophy/The-history-of-Western-ethics (accessed 29 August 2021).

https://www.britannica.com/topic/ethics-philosophy (accessed 20 July 2021).